023

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන- හයවන මට්ටම **2016/2017**

අවසාන පරීක්ෂණය - **2018**

අන්තර්කරණ අධ්‍යාපනය - **ESU4118**

කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2018.02.06** වේලාව - ප.ව.**01.30** - ප.ව.**04.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. සාර්ථක අන්තර්කරණ අධ්‍යාපනයක් සඳහා අනුගමනය කල යුතු අංග පහක් **(05)** සඳහන් කරන්න.

02. අන්තර්කරණ අධ්‍යාපනයේ ප්‍රතිලාභ පහක් **(05)** ලියන්න.

03. දුබලතා පිළිබඳ ප්‍රතිපත්තිවල මූලික සංකල්ප පැහැදිලි කරන්න.

04. බුද්ධිමය දුබලතා සහිත සිසුන්ගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වයේ සීමාසහිත බව විද්‍යාමාන වන සාධක පහක් **(05)** ලියන්න.

05. දෘෂ්ටි ඌණතා සහිත දරුවෙකු හඳුනා ගැනීමට තුඩුදෙන ඔහුගෙන්/ඇයගෙන් දිස්වන චර්යාමය ලක්ෂණ පහක් **(05)** සඳහන් කරන්න.

06. භාෂණ ගැටළු පහක් **(05)** ලියන්න.

07. ඉගෙනුම් දුබලතා සහිත ළමයින්ගේ ආවේනික ගුණාංග පහක් **(05)** සඳහන් කරන්න.

08. සුහග සිසුන් තුල දකින්නට ලැබෙන නිර්මාණාත්මක දක්ෂතා පහක් **(05)** ලියන්න.

(ලකුණු 5   8 = 40)

## 2 වන කොටස

09. (i) අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය සැකවින් විග්‍රහ කරන්න. (ලකුණු 08)

(ii) අන්තර්කරණ අධ්‍යාපනය පාසලේදී සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සහය විය හැකි, නාට්‍ය හා රංගකලා ගුරුවරුන් සතු කුසලතා පරීක්ෂා කොට විස්තර කරන්න. (ලකුණු 12)

10. (i) නිපුණතා පූර්ණ අන්තර්කරණ ගුරුවරුන්වීමට, සියලුම ගුරුවරුන් විසින් අත්පත් කරගත යුතු නිපුණතා උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ii) නාට්‍ය හා රංග කලා ගුරුවරුන් අන්තර්කරණ පංති කාමරයක් තුළ සාමාන්‍ය ගුරුවරුන්ට උදව් විය හැකි ආකාරය විමසන්න. (ලකුණු 12)

11. (i) අන්තර්කරණ ඉගෙනුම් පරිසරයක් සකස් විය යුතු ආකාරය විස්තර කරන්න. (ලකුණු 08)

(ii) අන්තර්කරණ ඉගෙනුම් උපාය මාර්ග, නාට්‍ය හා රංගකලාව විෂය තුළ, එකතු කර ගන්නේ කෙසේදැයි නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

12. (i) අන්තර්කරණ අධ්‍යාපනය සිසුන් තුළ සාර්ථක ඉගෙනුමක් ප්‍රවර්ධනය කරන්නේ කෙසේදැයි නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) සෑම ළමයෙක්ම ඉගෙනුම් ප්‍රවාහයට ඇතුළත් වන ආකාරයට ඉගැන්වීම විවිධාංගීකරණය කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 12)

13. (i) ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපනයේ ආරම්භයේ සිට වර්තමානය දක්වා විකාශනයේ ප්‍රධාන අවධීන් සඳහන් කරන්න. (ලකුණු 08)

(ii) අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය බිහිවීමේ පසුබිම විස්තර කරන්න. (ලකුණු 12)

14. (i) බහු සංස්කෘතික අධ්‍යාපන ක්‍රමයක ප්‍රධාන ඉලක්ක මොනවා ද? (ලකුණු 08)

(ii) 21 වැනි ශත වර්ෂයේ ගුරුවරුන් විසින් අත්පත් කරගත යුතු ගුරු නිපුනතා පහක් (05) සඳහන් කර එම නිපුණතා, අන්තර්කරණ ගුරුවරුන් සතු නිපුණතා සමඟ සංසන්දනය කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.